### වගා ගෘහය සඳහා පිරිවැය

අඩි 12 x අඩි 11 x අඩි 13 ගෘහයට දැමිය හැකි මුළු වගා මළු ප්‍රමාණය 3000 කි. එම වගා මළු ප්‍රමාණය සෑදීමේ සිට බීජ යෙදීම දක්වා වැය වන පිරිවැය

| අනු අංකය | ද්‍රව්‍යය | ප්‍රමාණය | ඒකකයක පිරිවැය (කි.ග්‍රෑ.) | මුළු පිරිවැය (රු.) |
|---|---|---|---|---|
| 01 | වගා මිශ්‍රණයට වියලි ලී කුඩු | 1200 | 1.50 | 1800.00 |
| 02 | ඉන්ධන පිරිමැසුම් ලිප සඳහා ලී කුඩු | 1000 | 1.50 | 1500.00 |
| 03 | හාල් නිවුඩු | 180 | 25.00 | 4500.00 |
| 04 | අළු හුණු | 24 | 16.66 | 400.00 |
| 05 | සමපෝෂ /සෝයා පිටි | 12 | 275.00 | 3300.00 |
| 06 | මැග්නීසියම් සල්ෆේට් | 2.400 | 50.00 | 120.00 |
| 07 | පොලි ප්‍රොපලීන් අඟල් 7 පළල දිග අඟල් 14 ගේජ් 200 | 30 | 400.00 | 12000.00 |
| 08 | රබර් බෑන්ඩ් | 0.500 | 50g-රු.50 | 500.00 |
| 09 | පුළුන් / කොටින් වේස්ට් | 1.5 | 200.00 | 300.00 |
| 10 | විෂබීජ නාශක | මි.ලී. 250 | 400.00 | 400.00 |
| 11 | බිම්මල් බීජ | පැකට් 50 | පැ. 1 ක් 90.00 | 4500.00 |
| 12 | ඉටිපන්දම් | පැකට් 01 | 250.00 | 250.00 |
| 13 | පිවානුහරණයට දර | කි.ග්‍රෑ.50 | 80.00 | 1000.00 |
| 14 | පිවානුහරණයට භූමිතෙල් | ලි. 1 | 55.00 | 110.00 |
| 15 | ශ්‍රමය මිනිස් දින | 15 | රු.600.00 | 9,000.00 |
| 16 | වෙනත් වියදම (ප්‍රවාහන) | - | - | 3,000.00 |
| **වගාමළු 3,000 සඳහා මුළු පිරිවැය** | | | | **42,680.00** |

**ලාභ විශ්ලේෂණය**

දළ ලාභය ගණනය (වගා මල්ලක් සඳහා මාස 2 1/2 ට)

| | |
|---|---|
| වගා මල්ලකින් ලැබෙන ආදායම (සටහන 1) | - රු. 68.75 |
| අඩු කලා | |
| වගා මල්ලක නිෂ්පාදන වියදම (සටහන 2) | - රු. 14.22 |
| වගා මල්ලකින් ලැබෙන ආදායම | - රු. 54.53 |

ශුද්ධ ලාභය ගණනය (වගා මළු 3000 ක් සඳහා මාස 2 1/2 ට)

| | |
|---|---|
| දළ ලාභය (සටහන 3) | - රු. 163,560.00 |
| අඩු කලා | |
| වගා ගෘහ සහ උපකරණ ක්ෂය (සටහන 4) | - රු. 2,221.00 |
| ශුද්ධ ලාභය | - රු. 161,339.00 |

**සටහන්:**

සටහන - 1

| | |
|---|---|
| වගා මල්ලකින් මාස 2 1/2 ට ලැබෙන අස්වැන්න | - 250g |
| 200g බිම්මල් පැකට් 01 ක මිල | - රු. 55.00 |
| වගා මල්ලකින් ලැබෙන ආදායම | - 250g x රු.55.00 / 200 g |
| | - රු. 68.75 |

සටහන - 2

| | |
|---|---|
| වගා මල්ලක නිෂ්පාදන වියදම | - රු. 42,680.00/3000 |
| | - රු. 14.22 |

සටහන - 3

| | |
|---|---|
| වගා මල්ලක දළ ලාභය | - රු. 54.53 (68.75- 14.22) |
| වගා මළු 3000 ක් සඳහා දළ ලාභය | - රු. 54.53 x 3000 |
| | - රු. 163,590.00 |

සටහන - 4

| | |
|---|---|
| මාස 2 1/2 ට ක්ෂය | - රු. 888.33x2.5 |
| | - රු. 2221.00 |


තාක්ෂණික උපදෙස් - ඉන්ද්‍රා ඊරියගම (පර්යේෂණ නිලධාරී)
උ.රෝ.නි. ක්ෂුද්‍ර ජීව විද්‍යා හා බිම්මල් පර්යේෂණ අංශය
උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නොරුව දු.ක. 081-2388011-13
චාමර විජේසිංහ - කෘෂි ආර්ථික විද්‍යාඥ (සමාජ ආර්ථික විද්‍යා අංශය), ප්‍රධාන කාර්යාලය, පේරාදෙණිය
තාක්ෂණික සහාය - උමයංගනී බණ්ඩාර (පර්. සහකාර) උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය
සැකසුම - ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය


# ලී කුඩු මාධ්‍යය මත ඔයිස්ටර් බිම්මල් වගාවේ ලාභ අලාභ විශ්ලේෂණය




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි - 2015

## හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ බහුලව ව්‍යාප්ත වී ඇති ඔයිස්ටර් බිම්මල්, ලී කුඩු සහ පිදුරු මාධ්‍යය භාවිතාකර පහසුවෙන් වගාකල හැකිය. මෙය ස්වයං රැකියාවක් මෙන්ම ව්‍යාපාරික ලෙසද ව්‍යාප්ත වෙමින් පවතී.

කෙටි කාලයකින්, අඩු වියදමකින් ඉහළ ආදායමක් ලබා ගැනීම සඳහා නිවැරදි තාක්ෂණය යොදා ගැනීම ඉතාමත් වැදගත් අතර, බිම්මල් වගාවේ දීර්ඝ කාලීනව රැඳී සිටීමටද උපකාර වේ. ලී කුඩු මාධ්‍ය භාවිතා කර ඔයිස්ටර් බිම්මල් වගාවට එකතුවන අය සඳහා පහත ඉදිරිපත් කර ඇති ලාභ අලාභ විශ්ලේෂණය වගාවේ ආරම්භයට මහගු පිටුවහලක් වේ.

පහත ඇස්තමේන්තුව ශ්‍රම දායකත්වය, අමු ද්‍රව්‍යවල දායකත්වය, මිල හා කාලය මත වෙනස් විය හැකිය.

**බිම්මල් වගා ගෘහය**




**මූලික පිරිවැය = ගෘහය සඳහා පිරිවැය + උපකරණ සඳහා පිරිවැය**
**= රු. 70,000.00 + රු. 18,300.00**
**= රු. 88,300.00**

*වගා ගෘහය සඳහා පිරිවැය*

| කාර්යය | පිරිවැය (රු.) |
|---|---|
| අත්තිවාරම් සහ බිත්ති ගොඩනැගීම සඳහා | 26,000.00 |
| වහලය සෑදීමට | 20,000.00 |
| බිමට සිමෙන්ති දැමීමට | 5,000.00 |
| දොර සෑදීමට | 4,000.00 |
| කෘමි ප්‍රතිරෝධි දැල ගැනීම සඳහා | 15,000.00 |
| මුළු පිරිවැය | 70,000.00 |

*උපකරණ සඳහා පිරිවැය*

| අනු අංකය | ද්‍රව්‍යය | ප්‍රමාණය | පිරිවැය (රු.) |
|---|---|---|---|
| 01 | ලී. 200 හිස් ග්‍රීස්/ඩීසල්/ සන්ක්වික් බැරලය | 01 | 1,500.00 |
| 02 | ඉන්ධන පිරිමැසුම් ලිප සඳහා | 01 | 2,000.00 |
| 03 | වගා ගෘහයේ රාක්ක සඳහා | 02 | 12,000.00 |
| 04 | කි.ග්‍රෑ. 50 දුණු තරාදි | 01 | 500.00 |
| 05 | සවල් | 01 | 500.00 |
| 06 | කි.ග්‍රෑ. 05 තරාදි | 01 | 1,000.00 |
| 07 | අත් ඉස්නා | 01 | 800.00 |
| | | එකතුව | 18,300.00 |

### ආදායම් ප්‍රකාශය

01. වගා ගෘහය සඳහා
ඇස්තමේන්තු පිරිවැය - රු. 70,000.00

02. වගාව සඳහා අවශ්‍ය
උපකරණ සඳහා පිරිවැය - රු. 18,300.00

ගෘහය සඳහා වාර්ෂික ක්ෂය අනුපාතය - 10%
(බිම්මල් ගෘහයේ ඵලදායි ජීව කාලය වසර 10 ලෙස උපකල්පනය කර ඇත)

ගෘහය සඳහා මාසික ක්ෂය රු. 70,000.00/10x12
රු. 583.33

උපකරණ සඳහා වාර්ෂික ක්ෂය අනුපාතය - 05%
(උපකරණ සඳහා ඵලදායි ජීව කාලය වසර 05 ක් ලෙස උපකල්පනය කර ඇත)

උපකරණ සඳහා මාසික ක්ෂය රු. 18,300.00/5x12
රු. 305.00

මුළු මාසික ක්ෂය වීම රු. 583.33 + 305.00
රු. 888.33

